# නිර්වාචික සන්නිවේදන ක්‍රමයක් ලෙස හස්ත සංඥා තුළ පවතින සන්නිවේදනාර්ථ හා අන්තර්සංස්කෘතික ලක්ෂණ
## (තෝරා ගත් හස්ත සංඥා කිහිපයක් ඇසුරෙන්)

අසිත මල්ලවආරච්චි
කථිකාචාර්ය
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
asithaprabhath@gmail.com

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණය හස්ත සංඥා පිළිබඳව සංඥාර්ථවේදී ප්‍රවේශයකින් අධ්‍යයනය කර ඇත. එහි දී හස්ත සංඥාවලින් අර්ථවත් කෙරෙන සන්නිවේදනාර්ථ හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙම අධ්‍යයනයේ දී හස්ත සංඥාවලින් සන්නිවේදනය කරන්නේ කුමක් ද? ඒ තුළ පවතින අන්තර්සංස්කෘතික ලක්ෂණ මොනවා ද? යන්න විශ්ලේෂණ ක්‍රමවේදය, ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ විධික්‍රම ඔස්සේ විමර්ශනයට ලක් කර ඇත. නිර්වාචික සන්නිවේදන ක්‍රමයක් ලෙස හස්ත සංඥාවල පවතින සන්නිවේදනාර්ථ හා අන්තර්සංස්කෘතික ලක්ෂණ විග්‍රහාත්මකව අධ්‍යයනය කර නිගමනවලට එළඹ ඇත. සන්නිවේදන ක්‍රියාවලිය තුළ හස්ත සංඥා භාවිතයේ දී ග්‍රාහකයා මෙන් ම සන්නිවේදකයා ද අභිප්‍රේරණ මානයක් කරා ගෙන යැවෙන සංජානනීය මාධ්‍යයක් වශයෙන් හස්ත සංඥා හඳුනාගත හැකි ය. එය සාර්ථක සන්නිවේදනයකට මඟ පාදන්නකි. විශේෂයෙන් ම මානව සම්බන්ධතා ඇති කිරීමට, පවත්වාගෙන යාමට හා වර්ධනය කර ගැනීමට මෙන් ම නතර කිරීමට ද ක්ෂණිකව මඟ පාදන සන්නිවේදන මෙවලමකි. ක්‍රියා හා වචන අතර පවතින සම්බන්ධය හා සමාන සම්බන්ධතාවක්, හස්ත සංඥා හා වචන අතර පවතින බව නිගමනය විය. ඒ අනුව සන්නිවේදන ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමට හස්ත සංඥා ඉතා මහඟු මෙහෙයක් සිදු කරයි. පුද්ගල හැසිරීම් අධ්‍යයනය කිරීමේ දී හා සමාජ අන්තර්ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සඳහා ඉතා පහසු මාර්ගයක් වශයෙන් හස්ත සංඥා හඳුනාගත හැකි ය.

ප්‍රමුඛ වචන - හස්ත සංඥා, සන්නිවේදනය, සන්නිවේදනාර්ථ, නිර්වාචික, සංඥාර්ථ